# හෙළ මාත්‍රා

මතු පරපුර උදෙසා වූ ජන සංස්කෘතික මෙවලම

විඳින්න ඔබ හට අපේ අත්දැකුම්
දකින්න ඔබ අප කියුම් කෙරුම්
රැඳෙන්න උප හා එය නිවැරදි නම්
රකින්න හෙළ ජන සංස්කෘතිය නම්

**ලාංකීය ජන සමාජයේ බොහෝ දෑ තුළින්**
**පෝෂණය වී හැදී වැඩුණු අප සතු**
**ගුණාත්මක මානුෂීය ආකල්පයන්**
**මතු පරපුර උදෙසා රැගෙන යන්නට**
**ඔබ සැමට හෙළ මාත්‍රා අප විසින් කෙරෙන**
**සුහද ආරාධනයයි මේ**

ළමා තරුණ හා වැඩිහිටි යන සියලු වයස් සීමාවන්
සඳහා වැඩමුළු (Workshops) 2014 ජනවාරි මාසයේ සිට ඇරඹේ

සියලුම විමසීම්

## හෙළ මාත්‍රා ජන සංස්කෘතික පදනම

0412 810 321 හෝ 0430 434 661
email : helamathra.aus@gmail.com




| CUT OFF DATE SYDNEY | END SYDNEY | ETA COLOMBO |
|---|---|---|
| 12 OCT 13 | 16 OCT 13 | 18 NOV 13 |
| 23 OCT 13 | 27 OCT 13 | 30 NOV 13 |
| 02 NOV 13 | 06 NOV 13 | 09 DEC 13 |
| 09 NOV 13 | 13 NOV 13 | 16 DEC 13 |
| 07 DEC 13 | 11 DEC 13 | 13 JAN 14 |

20 වන පිටෙන්

බැල්මට පෙනෙන විග්නේශ්වරන් වැනි පුද්ගලයකු උතුරු පළාත් සභාවේ නායකත්වයට පත් වීම අගය කළ යුතු දෙයකි. වයෝවෘද්ධ සම්බන්ධන්ගේ නායකත්වයට විකල්ප නායකත්වයක් ද දෙමළ ජාතික සන්ධානයෙන් මතු විය යුතු ය. උතුරු පළාත් සභාව යනු ජාතිවාදයේ හා ලිබරල්වාදයේ තුලනයකි. මැදිහත් වන්නන්ගේ වගකීම වන්නේ ලිබරල් ප්‍රවණතා ශක්තිමත් වන සේ එය කිරීමයි. එය මහත් පරිස්සමෙන් කළ යුතු දෙයකි.

දැන් උතුරු පළාත් සභාවේ උත්සවවලදී ජාතික කොඩිය එසවීමේ මැලිකමක් දක්නට ලැබේ. එය සිදු වන්නේ දෙමළ ජාතිවාදීන්ගේ බලපෑම මත ය. සිංහ කොඩිය වෙනුවට කොටි කොඩිය ඔසවන්නට තිබේ නම් ඔවුහු කැමති ය. දකුණ උත්සාහ කරන්නේ බලය පාවිච්චි කර කොඩිය උස්සන්නට ය. එහෙත් එය සාර්ථක වන්නේ නැත. බලය පාවිච්චි කරන්නට, කරන්නට සිදු වන්නේ වෛරය තව තවත් උත්සන්න වීම පමණි. එතකොට විසඳුම කුමක් ද?

මෙයට ඇති විසඳුම දෙමළ ජනයා කැමැත්තෙන් කොඩිය උස්සන තත්වයක් ඇති කර ගැනීම ය. එය කර ගැනීමට නම් අනිවාර්යයෙන් ම කොඩිය වෙනස් කළ යුතුව තිබේ.

කොටියා දෙමළ ජාතිවාදයේ සංකේතයක් බව ඔබ පිළි ගන්නවා නේ ද? එය කිසි සේත් ම ලංකාවේ ජාතික කොඩියේ තිබිය නො හැකි ය.

දෙමළ ජනතාව සිංහ සංකේතය ගැන සිතන්නේ ද ඒ අන්දමින් ම ය. ඔවුන්ට සිංහයා යනු සිංහල ආක්‍රමණයේ සංකේතයකි.

මේ මොහොතේ අප හමුවේ තිබෙන දේශපාලන අභියෝගය වන්නේ සිංහල බෞද්ධ මූලික ශ්‍රී ලංකාව වෙනුවට ජාතීන්ට සම තැන හිමි අනාගමික ලාංකීය ජාතික රාජ්‍යයක් දක්වා ගමන් කිරීම බව අපි මීට පෙර ද සඳහන් කළෙමු.

ජාතික කොඩිය ගැන කාරණයට අදාළව ගත්තොත්, අලුත් ලාංකීය ජාතියට අලුත් කොඩියක් යෝජනා කළ යුතුව තිබේ. අප ඉලක්ක කළ යුතුව තිබෙන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් ආදී ජනවාර්ගික අනන්‍යතාවලට වඩා ලාංකිකත්වය වැදගත් වන ජාතික රාජයක් වන බැවින් මගේ යෝජනාව වන්නේ ජාතික කොඩිය ජනවාර්ගික හා ආගමික සංකේතවලින් තොර එකක් විය යුතු බවයි.

හරියට නිල් පාට පසුබිමක්(සාගරය) මැද ලංකාවේ සිතියම වගේ කාටත් පොදු ලාංකික කොඩියක්.

## VCE Chemistry 2014

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage**
0407664546

